මහරගම නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 21 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර තැන්පතු 09 ක් වෙනුවෙන් ලද පොළිය මත රු.580,947 ක රඳවා ගැනීමේ බදු අඩුකර ගිණුම්ගත කර තිබුණි. | රාජ්‍ය ආයතන සඳහා රඳවා ගැනීමේ බදු අඩු නොකෙරේ. | පිළිගනිමි. එම රඳවා ගැනීමේ බදු නැවත සභාව වෙත ඉල්ලා ලංකා බැංකුව හා ජාතික ඉතිරි බැංකුව වෙත ලිපි මගින් දැනුවත් කර ඇත. |
| (ii) | ස්ථාවර තැන්පත් කල්පිරෙන දිනය අනුව නිවැරදිව පොළිය ගණනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයට අදාළව රු.111,414 ක් අඩුවෙන් ද , ප්‍රවර්තන වර්ෂයට අදාළව රු.4,112,911 ක් හා ලැබිය යුතු පොළිය රු.3,427,672 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පත් කල්පිරෙන දිනය අනුව නිවැරදිව පොළිය ගණනය කළ යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ ස්ථාවර තැන්පත් ආයෝජන ගිණුම හා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ගිණුම අවශ්‍ය සටහන් යොදා සකස් කරන ලදී . |
| (iii) | මුද්දර ගාස්තු වලින් අයකිරීමේ පදනම මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2018 වර්ෂයේ ලබාගත් රු.29,384,000 ක් වටිනා කම්පැක්ටර් 02 සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් රු.7,108,250 ක් 2019 වර්ෂයේ නිවැරදි නොකිරීම හේතුවෙන් අයකරගත හැකි උපයෝගිතා සේවා ගිණුම හා පළාත් සභා ණය | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදී නිවැරදි කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්වල ශේෂයන් එම වටිනාකමෙන් වැඩියෙන් පෙන්වා තිබුණි. | | |
| (iv) | ආපසු ගෙවන ලද රු.35,000 ක සේවක ඇප තැන්පත්, එම ගිණුමේ සටහන් වුවද ආයෝජන පොලී ගිණුමේ සටහන් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (v) | උපලේඛන හා ලෙජර් ගිණුම්වල ආරම්භක ශේෂයන්හි පැවති වෙනස්කම් සඳහා හේතු සොයා බලා ඒ අනුව ගිණුම්වල ගැලපීම් කරනු වෙනුවට අවස්ථා 05 කදී රු.3,144,480 ක් ජ'නල් සටහන් මඟින් ගිණුම්වලට ගලපා තිබුණි. | උපලේඛන හා ලෙජර් ගිණුම්වල ශේෂ සසඳා නිවැරදි කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන්, ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.7,654,906 ක් වැඩියෙන් හා රු.295,806 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | හඳුනාගත් වෙනස්කම් කිහිපයක් 2020 නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ii) | නාගරික සංවර්ධන අරමුදල් ආයෝජන ගිණුමේ ශේෂය රු.30,118,276 ක් වුවද එම තැන්පත් ගිණුමේ ශේෂය රු.36,979,385 ක් වීමෙන් රු.6,861,109 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | 2019 ජනවාරි 01 දිනට ව්‍යාපාර බදු ලේඛනය අනුව හිඟය රු.201,685 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපාර බදු හිඟය රු.534,685 ක් වූයෙන් රු.333,000 ක වෙනසක් විය | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**(ඇ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගනුදෙනුකරුවන් විසින් ලබා දී තිබූ රු. 311,581 ක් වටිනා චෙක්පත් 09 ක් අගරු වී තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.122,216,801 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් සඳහා අවශ්‍ය උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය උපලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

1.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තී රණවලට වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| XXIV පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | සේවක ණය අයකරගත නොහැකි විට ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අය කළ යුතු වුවද නිළධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.574,983 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | XXIV පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ඇපකරුවන් ගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී . |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 371 (2)(ඇ) හා (5) | ලබාගත් අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද දින 32 සිට 281 දක්වා කාල ප්‍රමාදයක් සහිතව රු.225,000 ක අත්තිකාරම් පියවීම් කළ අවස්ථා 10 ක් පැවතුණි. | මු.රෙ. 371 (2)(ඇ) හා (5) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී ප්‍රමාදයන් වළක්වා ගැනීමට සටහන් කර ගතිමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** මූල්‍ය **ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.416,367,303 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.62,788,166 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 අගෝස්තු මාසයේ දී වසා තිබුණු ජංගම ගිණුමක පැවති මුදල් රු.2,052,258 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුමේ දක්වා තිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විමර්ෂණයෙන් පසු සකස් කරන ලද වාර්තාව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇත. ගැටලුවට විසඳුමක් ලැබුණ පසු ගිණුමෙන් ගැලපීමට කටයුතු කරනු ලැබේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | (රු) 000' | (රු) 000' | (රු) 000' | (රු) 000' | (රු) 000' | (රු) 000' | (රු) 000' | (රු) 000' |
| i | වරිපනම් හා බදු | 111,112 | 101,109 | 105,690 | 57,384 | 102,506 | 109,778 | 109,821 | 61,387 |
| ii | කුලී | 28,095 | 23,263 | 27,719 | 4,722 | 21,167 | 26,334 | 25,012 | 4,487 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,904 | - | 1,783 | - | 1,203 | - | 1,602 | - |
| iv | වෙනත් ආදායම් | 332,528 | - | 280,722 | - | 260,565 | - | 31,834 | - |
| | | 473,639 | 124,372 | 415,914 | 62,106 | 385,441 | 136,112 | 168,269 | 65,874 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් ආදායම රු.91,296,836 ක් වුවද ඉන් රු.31,044,560 ක් හෙවත් සියයට 23 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වරිපනම් බදු ආදායම අය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ බිල් කළ ආදායමෙන් සියයට 76.74 ක් රැස් කර ඇත. 2018 හා 2019 වර්ෂයන්හි ද පැවති හිඟ ශේෂයෙන් සියයට 50.93 ක් රැස්කර ඇත. |

**2.3.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 155 කින් රු.4,722,410 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂයේදී පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ යුතුව තිබුණු රු.6,566,468 ක් වටිනා ව්‍යාපෘති 09 කින් රු.540,000 ක් වටිනා ව්‍යාපෘති 03 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කිරීම , රු.1,841,468 ක් වටිනා ව්‍යාපෘති 02 ක් සඳහා විරෝධතා මතුවීම සහ රු.4,185,000 ක් වටිනා ව්‍යාපෘති 04 ක් වෙනත් විවිධ කාරණාද හේතුවෙන් ඉටු නොකර අවලංගු කර තිබුණි. | විධිමත් විමර්ෂණයක් සිදුකර ගැටලු විසදා ව්‍යාපෘති ඉටු කිරිමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති 06 ක් සඳහා ඇතිවූ ගැටලු හේතුවෙන් සිදු කර නැත. |
| (ii) | 2019 වර්ෂයේදී පළාත් සභා ආධාර යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 158 කින් රු.24,825,000 ක් වටිනා ව්‍යාපෘති 15 ක් ද, ගම්පෙරලිය යටතේ ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 64 කින් රු.14,595,000 ක් වටිනා ව්‍යාපෘති 25 ක් ද සුබිත පුරවර යටතේ ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 08 කින් ව්‍යාපෘති 05 ක් ද ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිවිසුම්ගත වූ ව්‍යාපෘති ඉටු කිරිමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති බලධාරීත්වය දරන පළාත් සභාව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවලංගු කර තිබුණි. |

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී පොදු අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 200 ක් අතරින් රු.6,384,000 ක් වටිනා ව්‍යාපෘති 10 ක් කාලගුණික හේතු, ගිවිසුම්ගත වීමේ ප්‍රමාදය හා ප්‍රතිපාදන නොමැති වීම ආදිය හේතුවෙන් වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | අදාළ කාල සීමාව තුළ ඉටු කිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. මහජන විරෝධතා, මායිම් ගැටළු, නීතිමය ගැටළු, කාලගුණික හේතු ආදීය නිසා ගැටළු නිරාකරණය කර ගන්නා තෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇත. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාව විසින් කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.16,470,000 ක් වැඩිපුර ගෙවීමට සිදු ව තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කළ යුතුවේ. | පිළිගනිමි . කසළ වෙන් කර ලබා දීම සම්බන්ධව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ද ක්‍රියාත්මක කර ඇත. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 24 ක් පැවතිණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | **සේවක ණය** | | |
| (i) | 1988 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයට අදාළ මියගිය සේවකයින් 07 දෙනෙකුගෙන් රු.249,103 ක් ද, සේවය හැරගිය සේවකයින් 07 දෙනෙකුගෙන් රු.121,101 ක් ද, විශ්‍රාම ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් රු.34,639 ක් ද, ස්ථානමාරු වී ගිය සේවකයින් 02 දෙනෙකුගෙන් රු.195,493 ක් ද වශයෙන් එකතුව රු.600,336 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ලේඛන පරීක්ෂා කරමින් සිදුව ඇති අඩුපාඩු නිවැරදි කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට සේවකයින් 05 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.117,317 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණු අතර අයවිය යුතු ලෙස ගිණුම්ගත කිරීමක්ද කර නොතිබුණි. | ණය මුදල් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කරමින් සිදුව ඇති අඩුපාඩු නිවැරදි කරමින් පවතී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | කඩ කුලී ගිවිසුම අනුව බදුකරු මාස 06 කට අධික කාලයක් කුලී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් කුලී ගිවිසුම ඒකපාර්ෂිකව අවලංගු කිරීමේ බලය නගර සභාව සතු වුවත් කුලී ප්‍රමාද වූ කඩ කාමරවල කුලී ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලී ගිවිසුම් අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී මාස 06 ක් හිඟ කඩකුලී ඇති කඩ හිමියන්ගේ ගිවිසුම් අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | නාවින්න ක්‍රීඩාංගනය අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රවර්තන වර්ෂයේදී රු.13,717,577 ක් ඇතුළුව එකතුව රු.24,554,972 ක් ගෙවා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පුවක් මඟින් පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2019.01.22 වන විට මුදල් ගෙවා අවසන් බැවින් ක්‍රීඩාංගනය පවරා දීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස සභාපති නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කර ඇත. |

**3.5 හඳුනාගත් පාඩු**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2010 සිට 2019 දක්වා වූ කාලසීමාව තුළ සාමාජිකයන් 87 කට නිකුත් කළ රු.43,227 ක් වටිනා පුස්තකාල පොත් 148 ක් ආපසු භාර ගෙන නොතිබුණි. | පුස්තකාල පොත් ලබා ගැනිමට හෝ අලාභ අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. පොත් ආපසු භාර දෙන ලෙස ලිපි යැවුවද භාර නොදීම හේතුවෙන් 2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණයෙන් පරිග්‍රහණ ලේඛණයෙන් ඉවත් කිරිමට නිර්දේශ කර ඇත. |
| (ආ) | සභාව සතු වාහනයක් 2017 නොවැම්බර් 03 දින අනතුරකට ලක් වී තිබූ අතර ප්‍රාරම්භක වාර්තාව අනුව එහි අලාභයේ ඇස්තමේන්තු වටිනාකම වු රු.500,000 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා මිලදී ගත් විදුලි පහන් 11150 කින් වගකීම් කාලය ඉක්ම යාමට පෙර දැවී ගොස් තිබූ විදුලි පහන් 4928 න් විදුලි පහන් 761 ක් නැවත මාරු කර ගෙන නොතිබුණි. | වගකීම් කාලය ඉක්ම යාමට පෙර සේවාව ලබාගත යුතුවේ. | පිළිගනිමි. මාරු කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ටෙන්ඩර් කිරීමේදී ඇගයීම් කිරීමට අදාළ තොරතුරු ටෙන්ඩර්පත් සමඟ කැඳවා නොතිබීම හේතුවෙන් එක් බදු දේපළක් දෙවන වරට ටෙන්ඩර් කිරීමට සිදුවීමෙන් රු.91,988 ක පාඩුවක් සිදු වී තිබුණි. | ටෙන්ඩර් කැඳවීමේදී අදාළ තොරතුරු කැඳවා ගත යුතුවේ. | පිළිගනිමි. 2019.01.17 වන දින මහ සභාව ගත් තීරණයකට අනුව දෙවන වරටත් ටෙන්ඩර් කිරීමට සිදු විය. |
| (ඉ) | ටෙන්ඩර් කිරීමේ අඩුපාඩු හේතුවෙන් එක් බදු දේපළක් ප්‍රවර්තන වර්ෂය සඳහා 2019 දෙසැම්බර් 01 දින ගිවිසුම්ගත වීමෙන් රු.1,100,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | වාර්ෂිකව බදු දීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයට බදු දීම සඳහා 2018 දෙසැම්බර් 28 දින ටෙන්ඩරය විවෘත කළද 2019.01.17 දින පැවැත්වූ මහ සභාව විසින් මෙය නැවත ටෙන්ඩර් කළ යුතු බව තීරණය කිරීම හේතුවෙන් කමිටුව විසින් ප්‍රවර්තන වර්ෂයේ ටෙන්ඩර්කරු වෙත ලබා දීමට තීරණය කර ඇත. |